# 2024

# කාර්යය සාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# Performance Report




රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

அரசாங்கத் தொழிற்சாலைத் திணைக்களம்

DEPARTMENT OF GOVERNMENT FACTORY

# 2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
## වැය ශීර්ෂ අංකය - 310

**අන්තර්ගතය** **පිටු අංක**


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය 02
1.1. හැඳින්වීම 02
1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම,මෙහෙවර,අරමුණු 04
1.3 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් 05
1.4 තත්කාලීනව කරනු ලබන ප්‍රධාන නිෂ්පාදන කාර්යයන් හා ලබා දෙනු ලබන සේවාවන් 06
1.5 අප දෙපාර්තමේන්තුවේ සතුටුදායක සේවාලාභීන් 07
1.6 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය 08
1.7 2024 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය හා විශේෂ සේවාවන් 09

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 16

පරිච්ඡේදය 03 - වසරේ මූල්‍ය කාර්ය සාධනය
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 18
3.2 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය 22
3.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්යය සාධනය 22
3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 22
3.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව 23

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක 39

4.1 දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක ( ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව ) 39

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 39
5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 39
5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 39

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 40

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 40
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිගය / අතිරික්තයේ බලපෑම 40
6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වූ ආකාරය 41

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 43

## 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තුවක් වශයෙන් 1849 වර්ෂයේ කොළඹ ගැස් වීදියේ ආරම්භ කරන ලද රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පසුකාලීනව එනම් 1928 වර්ෂයේ සිට කොලොන්නාව දෙමටගොඩ මාර්ගයේ ඛණිජ තෙල් සංකීර්ණය අසල පිහිටුවා ඇත.

ආරම්භක කාල සීමාවේදී මහා මාර්ග, පාලම්, වාරිමාර්ග, ගොඩනැගිලි ඉදිකිරීම් යනාදී යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දායක වී ඇති අතර විදේශීය ඉංජිනේරුවන් විසින් මෙම ආයතනය මෙහෙයවා ඇත.




1969 දක්වා මෙලෙස ක්‍රියාත්මක වූ රජයේ වැඩ දෙපාර්තමේන්තුව එමගින් ඉටු කළ මහාමාර්ග තැනීම, නඩත්තුව සහ ගොඩනැගිලි ඉදිකිරීම සහ නඩත්තුව යනාදී සිවිල් ඉංජිනේරුමය කාර්යයන් සඳහා මහාමාර්ග දෙපාර්තමේන්තුව හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවද, යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් ඉටු කිරීම සඳහා "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ද, 1971.01.10 දින ස්ථාපනය කර ඇත.



බොල්ගොඩ පාලම ඉදිරිපස පෙනුම
1938 ජනවාරි 20

එතැන් සිට විවිධ රජයේ ආයතන මෙහෙයවීම සඳහා අවශ්‍ය වූ යාන්ත්‍රික ඉංජිනේරුමය සහායක සේවාවන් සැපයීම සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ අත්තිකාරම් ගිණුම් ක්‍රමයක් යටතේ පවත්වාගෙන යනු ලැබේ.



කාලානුරූපීව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් හා පොදු පහසුකම් අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ වර්තමානයේ **නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය** යටතේ අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී.

මේ වන විට ශ්‍රී ලංකාව තුළ ජල කළමනාකරණ දියදොරටු නිර්මාණය කර සවි කිරීමේ වෙළඳපොළෙහි ප්‍රමුඛස්ථානය රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත හිමිව තිබේ. මෑතකදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නිම කරන ලද බොහෝ මහා පරිමාණ ජල ව්‍යාපෘතිවල ජල පාලන දියදොරටු සියල්ලම නිර්මාණය කර සවි කරන ලද්දේ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසිනි. වෙහෙරගල, දැදුරු ඔය, පේ ආරු, රාජාංගනය, තොණ්ඩමනාරු, අට්ටික්කාව සහ රඹකැන් ඔය ජලාශ ව්‍යාපෘතීන් මින් කිහිපයකි.



**වැල්ලවත්ත පාලම**
**1939 අගෝස්තු 03**

ඊට අමතරව පානීය ජලය ලබාදීම වෙනුවෙන් පිරිපහදු ටැංකි නිර්මාණය කර සවිකිරීම සිදු කරන ලදි. උක්ත භාණ්ඩ හා සේවා වලට අමතරව, මුදල් රෙගුලාසි මගින් හා විවිධ අණපනත් හා ගැසට් මගින් පැවරී ඇති උපදේශාත්මක කටයුතු හා අත්‍යාවශ්‍ය සේවා කටයුතු රැසක්ම ඉටු කරනු ලබයි.

රටතුළ යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රෙය් නිපුණ කාර්මික මහතුන්, උපාධිධාරීන් හා වරලත් ඉංජිනේරු මහතුන් බිහි කිරීමට අවශ්‍ය කාර්මික පුහුණු ලබාදෙන රජයේ ප්‍රමුඛතම ආයතනයකි.

තවද පුද්ගලික අංශ මගින් ඉටුකර ගැනීමට අපහසු හා අධි ආරක්ෂිත කලාපවල විවිධ වූ ඉදිකිරීම් සඳහා මෙන්ම රාජ්‍ය උත්සව වලට අවශ්‍ය ඉදි කිරීම් සඳහා මෙන්ම රාජ්‍ය උත්සවවලට ඉදි කිරීම් කටයුතුද රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන ප්‍රධානතම කාර්යයකි.

රජයේ කර්මාන්තශාලාව විසින් යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ කරනු ලබන නිෂ්පාදන සහ සේවා ඉටු කරනු ලබන්නේ භාණ්ඩාගාරයේ කළවැඩ අත්තිකාරම් සහ ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය යටතේ වන බැවින් මෙම දෙපාර්තමේන්තුව රාජ්‍ය අංශයේ වාණිජ කටයුතු මෙහෙයවන සුවිශේෂී දෙපාර්තමේනතුවක් වශයෙන් හැඳින්විය හැක.

නිෂ්පාදන සහ නඩත්තු කාර්යයන් සඳහා යොදවනු ලබන දෙපාර්තමේන්තුගත නිලධාරීන්ට සහ සේවක පිරිස් සඳහා වැටුප් ගෙවීමට මාසිකව රුපියල් මිලියන 12ක මුදලක් පාරිභෝගිකයින්ගෙන් උපයා ගත යුතු වේ. මේ සඳහා මහා භාණ්ඩාගාරය විසින් අරමුදල් සපයනු නොලැබේ.

ශ්‍රී ලංකා ජාතික තත්ව ප්‍රතිපත්තිය අනුව යමින් 2013 වර්ෂයේදී රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ISO 9001:2008 ජාත්‍යන්තර තත්ත්ව පද්ධති සහතිකය දිනා ගැනීමට සමත් විය. මෙම සහතිකය උපයා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග තුලින් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීමට හැකි වූ අතර 2024 වර්ෂය තුලදී ISO 9001:2015 ජාත්‍යාන්තර තත්ත්ව පද්ධති සහතිකය 2025 දක්වා යාවත්කාලීන කරන ලදී.

ඊට අමතරව CIDA ආයතනයේ ඉදිකිරීම් වෙනුවෙන් EMI (Heavy Steel Fabrication) 2025 දක්වා අලුත් කරන ලදි. EMF (Elevators, Escalators & Revelators) 2024 දක්වා අලුත් කරන ලදි. SP2 Carpentry & Joinery) 2025 දක්වා අලුත් කරන ලදි. TVEC යටතේ වැද්දුම් ශිල්පය හා වාත්තු තාක්ෂණ පාඨමාලා සඳහා ලියාපදිංචි වීම. මේ මගින් අප විසින් ඉටු කරන පාරිභෝගික සේවා වල වර්ධනයක්ද ඇති කිරීමට හැකියාව ලැබී ඇත.



**තෝප්පුව පාලම**
**1938 ඔක්තෝම්බර් 24**

1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු

## දැක්ම

තිරසාර සංවර්ධනය තුලින්, ශ්‍රී ලාංකීය යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ නිෂ්පාදන, සේවා සහ පුහුණුව සපයන විශිෂ්ඨතම රාජ්‍ය ආයතනය බවට පත්වීම.

## මෙහෙවර

“රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත, යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ වැඩ, නිෂ්පාදන, සේවා සහ උපදේශන සේවා සැපයීම. තාක්ෂණික ඉංජිනේරු ආධුනිකයින්, වෘත්තීය ඉංජිනේරුවරුන් වෙත, යාන්ත්‍රික වැඩ හා සේවා සම්බන්ධ ප්‍රායෝගික පුහුණුව ලබා දීම.”

## 1.3 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

# රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

### (අ) නිෂ්පාදන ක්ෂේත්‍රය

රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් සඳහා ලෝහමය, දැවමය භාණ්ඩ නිර්මාණය හා නිෂ්පාදනය

1. වාරිමාර්ග ජල කළමනාකරණ දිය දොරටු හා උපකරණ, ආරෝග්‍යශාලා උපකරණ.
2. දැව ගෘහ භාණ්ඩ දැව භාණ්ඩ.
3. චීනච්චට්ටි හා නිෆෙරස් වාත්තු.
4. පොලිස් දෙපාර්තමේන්තුව සඳහා නිල පටි, තරු, අංක තහඩු නිෂ්පාදනය කිරීම.
5. තැපැල් දෙපාර්තමේන්තුව හා වෙනත් දෙපාර්තමේන්තු සඳහා දින මුද්‍රා හා ඒ සඳහා අවශ්‍ය වන කැට නිෂ්පාදනය.
6. නාම පුවරු.

### (ආ) ඉදිකිරීම් ක්ෂේත්‍රය (බර වැඩ්දුම්)

1. වාරිමාර්ග ජලාශ සඳහා විවිධ වර්ග වල ජල පාලන දිය දොරටු නිර්මාණය, නිෂ්පාදනය සහ සවි කිරීම.
2. පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති විහාරස්ථාන සහ බුද්ධ ප්‍රතිමා සඳහා ආරක්ෂක වැටවල් සහ ආරක්ෂිත වහල ඉදිකිරීම.
3. යකඩ සැකිළි මත ඉදි වූ ගොඩනැගිලි සෑදීම.
4. ගොඩනැගිලිවල දැව සහ ලෝහමය වහල ඉදි කිරීම.
5. රාජ්‍ය උත්සව, දේශීය හා විදේශීය රාජ්‍ය නායකයින්, විශේෂ ආරාධිත අමුත්තන් පිළිගන්නා උත්සව සඳහා හිරු ආවරණ, වේදිකා, කුටි ඉදි කිරීම.
6. යකඩ පාලම් ඉදිකිරීම.
7. ජල පවිත්‍රාගාර ටැංකි නිර්මාණය හා සවිකිරීම.

### (ඇ) අලුත්වැඩියා සහ නඩත්තු ක්ෂේත්‍රය

1. ආරෝග්‍යශාලා, ආයුර්වේද, රෝහල්, බන්ධනාගාර, ලුහු කර්මාන්ත ආදී ආයතනවල යන්ත්‍රෝපකරණ නඩත්තුව හා අලුත්වැඩියාව.
2. වාරිමාර්ග හා ගොවිජනසේවා දෙපාර්තමේන්තු වල හා අනෙකුත් ආයතනවල ජල කළමනාකරණ දිය දොරටු සහ උපාංග නඩත්තුව හා අලුත්වැඩියාව.
3. කාර්යාල වල දැව භාණ්ඩ නඩත්තුව හා අලුත්වැඩියාව.
4. යතුරු ලියන හා වායු සමීකරණ යන්ත්‍ර නඩත්තුව හා අලුත්වැඩියාව.
5. රාජ්‍ය ආයතනවල වාහන සේවා කිරීම.

### (ඈ) යාන්ත්‍රික ඉංජිනේරු උපදේශාත්මක සේවා

1. පශ්චාත් ඉංජිනේරු හා ඉංජිනේරු උපාධි අපේක්ෂකයින්, විවිධ පුහුණු ආයතනවල ආධුනිකයින් සඳහා ආයතනික ප්‍රායෝගික පුහුණුව ලබා දීම.
2. රාජ්‍ය ආයතනවල අලුත්වැඩියා කළ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා තත්ත්ව වාර්තා ලබා දීම.
3. රාජ්‍ය ආයතනවල තාක්ෂණික ඇගයීම් කමිටු, අපහරණ කමිටු හා තක්සේරු කමිටු සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
4. යාන්ත්‍රික ඉංජිනේරුමය නිෂ්පාදනය හා සේවා සහ උපදේශක සේවා සැපයීම.

1.4 තත්කාලීනව කරනු ලබන ප්‍රධාන නිෂ්පාදන කාර්යයන් හා ලබා දෙනු ලබන සේවාවන්

| අංකය | ආයතනය | සපයනු ලබන සේවාවන් |
|---|---|---|
| 01. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | අරිය දිය දොරටු හා අනෙකුත් වීනච්චට්ටි, දැව හා යකඩ ජලනල දිය දොරටු හා උපාංග නිර්මාණය හා සවි කිරීම. |
| 02. | රෝහල් | රෝහල් පවුඩර් කෝටින් කරන ලද හා සුදුයකඩින් නිෂ්පාදිත ගෘහ උපකරණ |
| 03. | පොලිස් දෙපාර්තමේන්තුව/ ආරක්ෂක අමාත්‍යාංශය | නිල පටි, නාම පුවරු, යාන්ත්‍රික සයිරන් නලා, නිල අංක තහඩු ද්විත්ව ඇඳන් |
| 04. | තැපැල් දෙපාර්තමේන්තුව | වර්ෂ, මාස හා දින කැට ඇතුළත් තැපැල් මුද්‍රා, ගෘහ උපකරණ, මෙවලම් නිෂ්පාදනය සහ යකඩ හා දැව ආශ්‍රිත නිමැවුම් |
| 05. | දුම්රිය දෙපාර්තමේන්තුව | වාත්තු හා යකඩමය නිෂ්පාදනයන් |
| 06. | පුනරුත්ථාපන/ ආයුර්වේද රෝහල් | යන්ත්‍රෝපකරණ සවි කිරීම සහ නඩත්තුව |
| 07. | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග බාධක හා සංඥා පුවරු, මෑන් හෝල් සැකිලි හා පියන්, යකඩ පාලම් |
| 08 | ජල සම්පාදන, ජල ප්‍රවාහන මණ්ඩලය | ජල පවිත්‍රාගාර ටැංකි ඉදිකිරීම / සවි කිරීම / අළුත්වැඩියාව |
| 09. | මැතිවරණ දෙපාර්තමේන්තුව | ඡන්ද පෙට්ටි සෑදීම, ගෘහ උපකරණ සැපයීම |
| 10. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | කාමර වෙන් කිරීම්, වහල අළුත්වැඩියා, වැසි අංක හා එන්ජින් අංක මුද්‍රණය |
| 11 | සියළුම රාජ්‍ය / පෞද්ගලික ආයතන | දැවමය ගෘහ භාණ්ඩ හා අනෙකුත් දැව නිෂ්පාදිතයන් |
| | | ස්ක්‍රීන් මුද්‍රණ, ඩිජිටල් මුද්‍රණ, දැන්වීම් පුවරු, කැටයම් වැඩ, එනේග්ව් (සැරිම) |
| | | එම්බෝස් (ඉලිප්පුම් වැඩ) , රාජ්‍ය ලාංඡන |
| | | දොර හා ජනෙල් නිෂ්පාදනය, බිත්ති පනේල (කැටයම්) කිරීම, පාටිෂන් කිරීම ( ඇලුමිනියම් හා දැව) |
| | | කැපීම, සිදුරු කිරීම, එතීම, හිල් විදීම (ඩ්‍රිල් කිරීම) වෑල්ඩින් සහ කම්මල් වැඩ, සියළුම යාන්ත්‍රණ වැඩ Planning, CNC, Milling |
| | | විශාල පිරිසැකසුම් වැඩ , සැහැල්ලු පිරිසැකසුම් වැඩ හා කම්මල් වැඩ හා ඇළුමිනියම් පිරිසැකසුම් වැඩ. |
| | | විදුලි වැඩ, Control Panel Board නිර්මාණය හා සෑදීම<br>විදුලි ස්ථාපනයන් හා අලුත්වැඩියාවන් |
| | | ඉලෙක්ට්‍රො ප්ලේටින් ( විද්‍යුත් ලෝහාලේපනය)<br>Powder coating කිරීම. |
| 12. | වරලත් ඉංජිනේරු, ඉංජිනේරු උපාධි අපේක්ෂකයින්, විවිධ තාක්ෂණික පුහුණු ආයතන | යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රායෝගික පුහුණුව ලබාදීම |

1.5 අප දෙපාර්තමේන්තුවේ සතුටුදායක සේවාලාභීන්

| අංකය | ආයතනය | ලබා දුන් සේවාවන් |
|---|---|---|
| **01** | ක්‍රීඩා අමාත්‍යාංශය | දැවමය උළුවහු හා දොර ජනෙල් සෑදීම |
| **02** | මහා භාණ්ඩාගාරය | දැවමය උළුවහු හා දොර ජනෙල් සෑදීම |
| **03** | මැතිවරණ දෙපාර්තමේන්තුව | ඡන්ද පෙට්ටි සෑදීම, අළුත්වැඩියාව හා නාම පුවරු සැකසීම |
| **04** | ගඟුර් ගොඩනැගිල්ල - කොළඹ 01 | දැවමය උළුවහු හා දොර ජනෙල් සෑදීම |
| **05** | ජනාධිපති මන්දිරය (අනුරාධපුර / නුවරඑළිය) | දැවමය උළුවහු දොර ජනෙල් සහ වහලය අළුත් වැඩියාව හා නඩත්තුව |
| **06** | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ජල පාලන දිය දොරටු හා උපාංග සැලසුම් කිරීම, නිෂ්පාදනය නඩත්තුව හා අළුත්වැඩියා කිරීම. |
| **07** | රජයේ රෝහල් | සියළුම රෝහල් ගෘහ උපකරණ (යකඩ සහ සුදුයකඩ) පව්ඩර් කෝටින් කිරීම හා අළුත්වැඩියා කිරීම. |
| **08** | පොලිස් දෙපාර්තමේන්තුව | නිල පටි, අංක තහඩු ගෘහ උපකරණ, තට්ටු ඇඳන් (දැව හා යකඩ) |
| **09** | තැපැල් දෙපාර්තමේන්තුව | වර්ෂ, මාස හා දින කැට ඇතුළත් තැපැල් මුද්‍රා, ගෘහ උපකරණ හා මෙවලම්, නාම පුවරු නිෂ්පාදනය හා යකඩ සැකිලි මත ගොඩනැගිලි ඉදි කිරීම. |
| **10** | අධිකරණ අමාත්‍යාංශය | දැවමය ගෘහ භාණ්ඩ, ලේඛණාගාර රාක්ක, නාම පුවරු |
| **11** | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව/ මධ්‍යම සංස්කෘතික අරමුදල | පුරා වස්තුන් සඳහා යකඩ වහළ නිර්මාණය, සෑදිම, සවි කිරීම, නාම පුවරු, කෞතුකාගාර ගෘහ භාණ්ඩ නිෂපාදනය, වීදි ලාම්පු කනු සදා සවි කිරීම. |
| **12** | දුම්රිය දෙපාර්තමේන්තුව | තිරිංග පලු හා දුම්රිය සංඥා සඳහා අවශ්‍ය භාණ්ඩ / උපකරණ |
| **13** | විදේශ කටයුතු අමාත්‍යාංශය | යකඩ හා දැවමය භාණ්ඩ / උපකරණ නඩත්තු කටයුතු සිදු කිරීම හා අළුත්වැඩියා කිරීම |
| **14** | මාර්ග සංවර්ධන අධිකාරිය/ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | යකඩ පාලම් සෑදීම සහ සවිකිරීම, නාම පුවරු සෑදීම. |
| **15** | ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය | ජල පවිත්‍රාගාර ටැංකි නිර්මාණය, සෑදීම හා සවි කිරීම |
| **16** | ගුවන්තොටුපල හා ගුවන්සේවා සමාගම | Gantry පුටු Powder coat කිරීම, වීදුරු බිත්ති ආවරණය කිරීම සඳහා ආවරණ (Fender) සවි කිරීම. |

## 1.6 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය




| | | | | | |
|---|---|---|---|---|---|
| ජේ.යා.අ - | ජ්‍යෝෂ්ඨ යාන්ත්‍රික අධිකාරී | ප්‍ර. සැ.ශි - | ප්‍රධාන සැලසුම් ශිල්පී | ජේ.යා.අ.සැ - | ජ්‍යෝෂ්ඨ යාන්ත්‍රික අධිකාරී (සැපයුම්) |
| සං.ව. නිල - | සංවර්ධන නිලධාරී | ජේ.යා.අ.ආ - | ජ්‍යෝෂ්ඨ යාන්ත්‍රික අධිකාරී (ආරක්ෂක) | යා.අධි - | යාන්ත්‍රික අධිකාරී |
| කා ග.ලිපි - | කාළගණක ලිපිකරු | පා.නි - | පාලන නිලධාරී | වැඩ.පරි - | වැඩ පරිපාලක |
| ප්‍ර.සමී.සහ - | ප්‍රමාණ සමීක්ෂණ සහකාර | වැඩ.ලිපි - | වැඩබල ලිපිකරු | අ.වැ ස - | අයවැය සහකාර |
| කළ සේ නි - | කළමණාකරණ සේවා නිලධාරී | අර්.ශිල්පී - | අර්ධ ශිල්පී | සු.සා.නි - | සුභසාධක නිලධාරී |
| කා.කා.ස - | කාර්යාල කාර්ය සහායක | වැ.හ සහ - | වැඩබල සහකාර | තො.ස.තානි - | තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිලධාරී |

1.7 **2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය (2024.12.31 දිනට) - කළ වැඩ අත්තිකාරම්**

| | ව්‍යාපෘති විස්තර | ඉලක්කය 2024 | | ප්‍රගතිය 2024.12.31 දිනට | |
|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුව (රු.මි.) | භෞතික (%) | ඇස්තමේන්තුව (රු.මි.) | භෞතික (%) |
| 1 | ඌව කුඩාඔය ජලාශයේ ජලපාලක දොරටු අංක 01ක් සහ ස්ථාවර රෝද ගේට්ටුවක් සකස් කිරීම සහ ස්ථාපනය කිරීම හා වාන් දොරටු 02ක් සඳහා හයිඩ්‍රොලික් එසවුම් පද්ධතියක් සවි කිරීම | 145 | 100 | 7.44 | 5 |
| 2 | 2024 ජාතික නිදහස් දිනය (සඳහා VVIP, VIP වේදිකා සැකසීම, ස්ථාපනය කිරීම සහ ප්‍රවාහනය කිරීම. | 48 | 100 | 39.42 | 100 |
| 3 | ඇල්ලේවැව වාත්තු යකඩ සොරොව් දොරටු හදිසි ගේට්ටුව සැකසීම, සැපයීම සහ ස්ථාපනය කිරීම. | 30 | 100 | 3.56 | 12 |
| 4 | විදුලි, යාන්ත්‍රික යාන්ත්‍රණ, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා නඩත්තු ඒකකය මගින් ඉටු කරන කාර්යයන් | 10 | 100 | 4.45 | 45 |
| 5 | බර පිරිසැකසුම් ඒකකය මගින් ඉටු කරන අනෙකුත් කාර්යයන්. | 20 | 100 | 68.31 | 100 |
| 6 | යාන්ත්‍රික දැව ඉරීම සහ දැව භාණ්ඩ සෑදීමේ ඒකකය මගින් ඉටුකරන කාර්යයන්. | 20 | 100 | 18.09 | 90 |
| 7 | සැහැල්ලු පිරිසැකසුම් ඒකකය මගින් ඉටු කරන කාර්යයන්. | 20 | 100 | 28.20 | 100 |
| 8 | වාත්තු වැඩ ඒකකය මගින් ඉටු කරන කාර්යයන් | 30 | 100 | 41.68 | 100 |
| 9 | සැහැල්ලු ඉංජිනේරු වැඩ ඒකකය මගින් ඉටු කරන කාර්යයන්. | 18 | 100 | 26.50 | 100 |
| 10 | වාහන අලුත්වැඩියා ඒකකය මගින් සිදු කරනු ලබන කාර්යයන්. | 02 | 100 | 2.64 | 100 |
| 11 | නඩත්තු අංශය | 03 | 100 | 9.14 | 100 |
| | **මුළු එකතුව** | **346** | 100 | **246.28** | **71** |

2024 වර්ෂයේ ජල කළමණාකරනයට අදාල දොරටු නඩත්තු කටයුතු කිහිපයක් සඳහා සම්බන්ධ විණි. එම කාර්යයන් පහත පරිදි වේ.

1. ඌව කුඩා ඔය ජලාශයේ වාන් දොරටු සඳහා හයිඩ්‍රොලික් එසවුම් පද්ධතියක් සවි කිරීම.
2. ඇල්ලෙවැව ජලාශයට සොරොව් දොරටු සවි කිරීම.
3. ඌව කුඩා ඔය ජලාශයේ සොරොව් දොරටු සවි කිරීම.
4. කොළඹ වෛද්‍ය පීඨයේ රථගාල සඳහා ගංවතුර පාලන දොරටුවක් සවි කිරීම.
5. අරියාලයි ජලාශයේ හා නාවක්කුලි ජලාශයේ සොරොව් දොරටුවල අලුත්වැඩියා කිරීම.
6. පුළුගුනාවි ජලාශයේ ගේට්ටුවල එසවුම් පද්ධතිය වැඩි දියුණු කිරීම.



තොන්ඩමනාරු බරාජයේ ජල පාලන දිය දොරටු



ඔලියමුල්ල ගේට්ටුව සෑදීම



නාවක්කුලි බරාජය




නිදහස් දින සැමරුම් වේදිකා



මොරාන




වාත්තු නිෂ්පාදන



ග්‍රැබ් බකට් අලුත්වැඩියාව



පුළුගුනාවි ව්‍යාපෘතිය සඳහා දිය දොරටු සැකසීම



ජල පාලක ගේට්ටුව - වෛද්‍ය පිඨය, කොළඹ



ඌව කුඩා ඔය - උමා ඔය ව්‍යාපෘතිය

## නව තාක්ෂණය භාවිතය




CNC Milling Machine






CNC Lathe Machine



Laser Cutter




CNC Plasma Cutter




Plano Miller Machine



Mini Cupola



Aluminum die casting




Induction Furnace

## 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2024 වසරේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ලබාගත් ජයග්‍රහණ හා මුහුණු දුන් අභියෝග

### විශේෂ ජයග්‍රහණ

* 2024 වර්ෂය තුළදී ISO 9001:2015 ජාත්‍යන්තර තත්ත්ව පද්ධති සහතිකය යාවත්කාලීන කරන ලදී. ඊට අමතරව CIDA ආයතනයේ ඉදිකිරීම් වෙනුවෙන් EMI (Heavy Steel Fabrication) 2024 වර්ෂයේදී අලුත් කරන ලදී. EMF (Elevators, Escalators & Revelators) 2024 වර්ෂයේදී අලුත් කරන ලදි. SP2 Carpentry & Joinery) 2024 වර්ෂයේදී අලුත් කරන ලදි.
* පුද්ගලික ආයතන සමඟ තරඟකර ජල පාලන දොරටු අවම මිළ ගණන් යටතේ සාදා සවිකිරීමට හැකිවීම.
* ආනයනික ජල පිරිපහදු ටැංකි පද්ධතියක් වෙනුවට දේශීයව සුදු යකඩ භාවිතා කර අවම පිරිවැයකින් ජල පිරිපහදු ටැංකි පද්ධතියක් නිර්මාණය කර තනා සවි කිරීමට හැකිවීම .
* පාරම්පරික නිශ්පාදන යන්ත්‍ර වෙනුවට නවීන තාක්ෂණය සහිත යන්ත්‍ර සූත්‍ර මිලදීගෙන කාර්යක්ෂම හා උසස් ප්‍රමිතියෙන් යුත් ද්‍රව්‍ය සැකසීමට කටයුතු කිරීම.

### අභියෝග

* තාක්ෂණික හා කාර්යාලීය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු දිගින් දිගටම පැවතීම හා කලට වේලාවට පිරවීමේ යන්ත්‍රණයක් නොතිබීම.

  උදා- රියදුරු පුරප්පාඩු පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුව සතු ලොරි රථ, ක්‍රේන් ආදිය ක්‍රියාත්මක කිරීමට රියදුරන් නොමැති වීමෙන් බාහිර පාර්ශවයෙන් කුලී පදනම මත එම වාහන ලබා ගැනීමට සිදුවීම. මේ හේතුවෙන් අමතර පිරිවැයක් දැරීමට ද සිදුවන අතර අදාළ ව්‍යාපෘති කාලය දීර්ඝ වීමටද මෙය හේතුවක් වේ.
* යාන්ත්‍රික ඉංජිනේරු ඉදිකිරීම් සේවා සහ නිෂ්පාදන සඳහා වෙළෙඳපොල ප්‍රමිතියක් නොමැති වීම හා මේ පිළිබඳව සොයා බැලීමට නියාමන ආයතන නොමැති වීම.
* සම්පූර්ණ කරන ලද කාර්යයන් සඳහා රාජ්‍ය ආයතනවලින් ලැබීමට නියමිත මුදල් නියමිත කාලවකවානු තුළ නොලැබීම.
* රාජ්‍ය ප්‍රතිපත්ති මත ප්‍රසම්පාදන ක්‍රියාවලින්ට අනුගතව කටයුතු කිරීමට සිදුවීම මත පුද්ගලික ආයතන සමඟ තරඟකාරී ලෙස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යාම දුෂ්කර වීම.
* කාර්යසාධන බැඳුම්කර, ලංසු බැඳුම්කර හා වෙනත් බැඳුම්කර ඉදිරිපත් කිරීමට නොහැකි වීම.
* 2013 වර්ෂයේ සිට PL කාණ්ඩයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනිම් සිදු කිරීමට අවස්ථාව සැලසී නොමැති බැවින් PL කාණ්ඩයේ පුරප්පාඩු පිරවීම ගැටලු සහගත වි ඇත.

### <u>ඉදිරි ඉලක්ක</u>

* දැනට ඇණවුම් ලැබීම ගිලිහී ගොස් ඇති වාරිමාර්ග දෙපාර්තමේන්තු ඇණවුම්, රෝහල් ගෘහ භාණ්ඩ ඇණවුම්, පොලිස්, තැපැල් දෙපාර්තමේන්තු ඇණවුම් නැවත ලබා ගැනීමට සාකච්ඡා කිරීම.
* මහාමාර්ග සම්බන්ධ ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන මෙවලම් විදේශයන්ගෙන් ගෙන්වීමෙන් තොරව දේශීයව නිෂ්පාදනය කර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
* සාමාන්‍ය මහජනතාව සඳහා අවශ්‍ය යාන්ත්‍රික හා දැවමය කාර්යන්වල නිෂ්පාදන හා සේවා ලබා දීමේ ක්‍රමවේදයක් ඇති කිරීම.
* රටේ වර්ථමාන අවශ්‍යතාවයට අනුව පුහුණු ආයතනයක් ස්ථාපිත කිරීම.
* නිශ්පාදන ධාරිතාව වැඩි කර ගැනීම සඳහා පුද්ගලික අංශ සම්බන්ධ කර ගැනීමට කටයුතු කිරීම.

**පරිච්ඡේදය 03 - වසරේ මූල්‍ය කාර්ය සාධනය**

**3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

**3.2 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය**

**3.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්යය සාධනය**

**3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

**3.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2024.12.31 දිනට අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**
**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 | | සටහන | සත්‍ය 2024 | 2023 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | | |
| - | | | | | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | 1 | 0 | 0 | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | 0 | 0 | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | 0 | 0 | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 0 | 0 | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | 0 | 0 | |
| - | ආදායම් නොවන ලැබීම් | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 338,687,744 | 238,390,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 46,074,944 | 44,817,959 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 510,897,796 | 643,411,167 | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | 0 | 0 | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 895,660,485 | 926,619,126 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 895,660,485 | 926,619,126 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 136,713,966 | 16,895,180 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) - (ඈ) | | 758,946,519 | 909,723,946 | |
| | අඩුකළා : වියදම් | | | | |
| | පුනරාවර්තන වියදම් | | | | |
| 91,543,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 88,820,886 | 88,317,269 | ඒසීඒ-2(ii) |
| 1,900,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 61,858,082 | 42,242,728 | |
| 1,200,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 884,682 | 1,168,218 | |
| - | පොලී ගෙවීම් | 8 | 0 | 0 | |
| 20,000,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 2,016,780 | 70,758,134 | |
| 114,643,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 153,580,430 | 202,486,349 | |
| | මූලධන වියදම් | | | | |
| 36,300,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 36,300,000 | 20,898,057 | ඒසීඒ-2(ii) |
| 45,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 44,947,644 | 1,998,225 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 0 | 0 | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | 0 | 0 | |
| 1,500,000 | හැකියා වර්ධනය | 14 | 1,466,693 | 1,691,793 | |
| 1,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 797,866 | 1,000,000.00 | |
| 83,800,000 | මුළු මූලධන වියදම් (උ) | | 83,512,202 | 25,588,075 | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | | | |
| | තැන්පතු ගෙවීම් | | 37,638,908 | 45,598,953 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 434,644,445 | 588,750,173 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | 0 | 0 | |
| | මුළු ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 472,283,354 | 634,349,127 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 709,375,986 | 862,423,550 | |
| | 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | 49,570,533 | 47,300,395 | |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | 49,553,403 | 47,300,395 | ඒසීඒ 7 |
| | 2024 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | 2 | 17,130 | 0 | ඒසීඒ 3 |

ඒසීඒ-පී

## 2024.12.31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
### රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

| | සටහන | සත්‍ය 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,054,175,497 | 1,009,227,853 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | (285,863,163) | (209,609,812) |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 17,130 | 0 |
| මුළු වත්කම් | | 768,329,464 | 799,618,041 |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (317,336,486) | (232,647,098) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,054,175,497 | 1,009,227,853 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම | ඒසීඒ- 5/5(බී) | 0 | 0 |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 31,473,323 | 23,037,286 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 17,130 | 0 |
| මුළු වගකීම් | | 768,329,464 | 799,618,041 |

පිටු අංක 06 සිට 35 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 36 සිට 42 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදු කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

..............................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නාම : ආර්. ආරියරත්න
තනතුර : ලේකම්
දිනය : 2025/2/26

රංජිත් ආරියරත්න
ලේකම්

..............................
ගණන්දීමේ නිලධාරි
නාම : ඒ. විජේසිංහ
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2025/02/21

ඉංජි. ඒ. විජේසිංහ

..............................
ප්‍රධාන ~~මූල්‍ය නිලධාරි~~/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නාම : ඩබ්. එච්. සී. හිමාලි
දිනය : 2025/02/21

ඩබ්ලිව්.එච් සී. හිමාලි
ප්‍රධාන ගණකාධිකාරී

3

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඒසීඒ-3

**2024.12.31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

| | සටහ | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| බදු ලැබීම් | | | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | | |
| ලාභ | | | |
| ආදායම් නොවන ලැබීම් | | | |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 35,147,211 | 16,883,010 |
| අග්‍රිම ලැබීම් | | 338,687,744 | 238,390,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 510,493,270 | 645,297,160 |
| තැන්පතු ලැබීම් | | 46,074,944 | 44,817,959 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | | 930,403,170 | 945,388,128 |
| අඩුකළා : <u>මුදල් වැය කිරීම්</u> | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 151,401,573 | 200,206,380 |
| සහනාධාර සහ මාරු කිරීම් | | 884,682 | 1,168,218 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 85,678,131 | 67,181,148 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 136,713,966 | 16,895,180 |
| අත්තිකාරම් ගෙවීම් | | 434,556,577 | 588,750,173 |
| තැන්පතු ගෙවීම් | | 37,638,908 | 45,598,953 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | | 846,873,838 | 919,800,053 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ) | | 83,529,332 | 25,588,075 |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| පොලී | | 0 | 0 |
| ලාභාංශ | | 0 | 0 |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | 0 | 0 |
| උප ණය අයකර ගැනීම් | | 0 | 0 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | | 0 | 0 |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| ප්‍රාග්ධන වියදම් | | 83,512,202 | 25,588,075 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | | 83,512,202 | 25,588,075 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ) | | (83,512,202) | (25,588,075) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ) | | 17,130 | 0 |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| දේශීය ණය ගැනීම් | | 0 | 0 |
| විදේශීය ණය ගැනීම් | | 0 | 0 |
| ප්‍රදානයන් ලැබීම් | | 0 | 0 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | | 0 | 0 |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | 0 | 0 |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | 0 | 0 |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | | 0 | 0 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | | 0 | 0<br>0 |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ) +(ඒ) | | 17,130 | 0 |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | | 0 | 0 |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | | 17,130 | 0 |

4

ඇමුණුම -(i)

# පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය
## (මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)
රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය: 310
වැඩසටහන් අංකය හා නාමය : 02, සංවර්ධන වැඩසටහන්

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

| අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු.) |
|---|---|---|---|
| රු. 25,000.00 | අඩු | | 16,780.00 |
| රු. 25,000.01 | වැඩි | | |
| එකතුව | | | 16,780.00 |

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය

| | සිද්ධි සංඛ්‍යාව | අගය (රු.) |
|---|---|---|
| | | 16,780.00 |
| එකතුව | | 16,780 |

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

| අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු.) |
|---|---|---|---|
| රු. 25,000.00 | අඩු | 1 | 20,050.00 |
| රු. 25,000.01 | වැඩි | | 927,738.27 |
| එකතුව | | | 947,788.27 |

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය

| | සිද්ධි සංඛ්‍යාව | අගය (රු.) |
|---|---|---|
| වාහන අනතුරු | | 683,940.00 |
| වෙනත් භාණ්ඩ සොරාගැනීම් | | 263,842.00 |
| එකතුව | | 947,782.00 |

(ii) අනුව කාල විශ්ලේෂණය

| | | |
|---|---|---|
| වසර 5 ට අඩු | සිද්ධි සංඛ්‍යාව | 7 |
| | ගණන - රු. | 947,788.27 |
| වසර 5-10 | සිද්ධි සංඛ්‍යාව | 0 |
| | ගණන - රු. | |
| වසර 10 ට වැඩි | සිද්ධි සංඛ්‍යාව | 0 |
| | ගණන - රු. | |

සටහන - වැය ශීර්ෂය 1701 යටතේ වර්ෂය තුළ නිශ්ලමගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී නිශ්ලමගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

............................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී
අධ්‍යක්ෂ (මුදල්)/කොමසාරිස් (මුදල්)
දිනය : 2025/02/21

36

### 3.2 වෙන් කරන ලද ප්‍රතිපාදන (පවතීනම්) උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය රු. 000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසන් ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | **167,000** | **179,443** | **153,580** | **86%** |
| ප්‍රාග්ධන | **83,300** | **83,800** | **83,512** | **97%** |

### 3.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්යය සාධනය රු.000

| පරිත්‍යාගය කළ අයතනය | පරිත්‍යාගයේ අරමුණ | පරිත්‍යාග මුදල |
|---|---|---|
| නැත | නැත | නැත |

### 3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යය සාධනය රු.000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2024 දිනය භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2024 දිනට මූල්‍ය තත්වය වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| **9151** | ගොඩනැගිලි හා ව්‍යුහයන් | ස්ථාවර වත්කම් සමීක්ෂණය යටතේ ඉහත අයිතමවල සමීක්ෂණ කටයුතු සිදු කාරීමට පහසුකම් නොමැති නිසා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂයන් ලබාදිය නොහැක. | **408,971** | **2025** වර්ෂය තුළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව හා මූල්‍ය තත්ව වාර්තාව සැසඳීම් කර ඇත. | **100%** |
| **9152** | යන්ත්‍රෝපකරණ | | **332,825** | | |
| | වාහන | | **72,379** | | |
| **9153** | ඉඩම් | | **240,000** | | |
| **9160** | කෙරීගෙන යන වැඩ | | **-** | | |

## 3.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. CAE/A/GF/FS/2025/04    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2025 මැයි 30 දින

අධ්‍යක්ෂ ජනරාල්
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

<u>ශීර්ෂය 310 - රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.</u>

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 310 - රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 29 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

CS CamScanner

වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. .

2

CS CamScanner

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.



CS CamScanner

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.6.1 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම

**(අ) අත්තිකාරම් සීමා පිළිපැදීම**

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ (විෂය අංක 31001) අයවැය ඇස්තමේන්තුව මඟින් අනුමත කර තිබූ අවම බැර සීමාව වූ රු. 16,000,000 ක අගය රු. 13,000,000 ක් දක්වා සංශෝධනය කර ගැනීමට අංක MUDC&H/2024/AD/B/01 දරණ ලිපිය මඟින් ඉල්ලීම් කර තිබුණද ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. එසේ වුවද විගණනයට ඉදිරිපත් කර තිබූ සැසඳුම් ප්‍රකාශයේ අනුමත ප්‍රතිශෝධිත අවම බැර සීමාව රු. 14,000,000 ක් ලෙස අනුචිතව දක්වා තිබුණි.

**(ආ) ලේඛණ පවත්වා ගැනීම**

i. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 14.9 ඡේදය පරිදි අත්තිකාරම් අය කිරීම් හා මාසික පොලී වාර්තා කොට තැබීම සඳහා CC10 පොදු ආකෘතියේ ලේඛණයක් පවත්වා ගත යුතු වේ. මෙම CC10 ලේඛණය පවත්වා ගැනීමේදී ණය වාරිකවලට අදාල එක් එක් මාසවල පොලී ගණනය කර

4

CS CamScanner

දක්වා නොතිබුණු අතර ලේඛණවල ණය හා පොලී අයකිරීම් එකතුව දක්වා නොතිබූ බවද නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

ii. ණය අත්තිකාරම් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කරනු ලබන නිලධාරීන්ගේ නම, වැටුප් අංකය, ඉල්ලීම කල දිනය, ඉල්ලීම් කරන ලද කාරණය හා ණය මුදල ඇතුලත් පොරොත්තු ලේඛණයක් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගත යුතු වුවත් එවැනි ලේඛණයක් පවත්වා ගෙන නොතිබුණි.

### 1.6.2 ගබඩා අත්තිකාරම් ගිණුම

(අ) මු.රෙ. 501 ප්‍රකාරව ගබඩා අත්තිකාරම් ගිණුම පවත්වා ගනු ලබන්නේ ලාභ උපයන අදහසින් හෝ පාඩු අපේක්ෂාවෙන් නොවන අතර, භාණ්ඩ ගෙන එනු ලබන මිලට භාණ්ඩ තොගය ගණන් ගනු ලබයි. ඒවා මිලදී ගැනීමට ගබඩා කිරීමට හා මෙහෙයුම් කටයුතු සඳහා වන වියදම් ආවරණය වන පරිදි පිරිවැයට සියයට 8 ක් එකතු කර තොග නිකුත් කරනු ලබන බව 2024 වර්ෂයේ ගබඩා අත්තිකාරම් ගිණුමේ පෙරවදනෙහි දක්වා තිබුණි. වර්ෂයේ නිකුත් කිරීම් වලින් නිකුත් කිරීමේ පිරිවැය රු. 67,342,343 ක මුදල හා රු. 9,031,952 ක සේවක වියදම් හා සැපයුම් වියදම් අඩුකල පසු රු. 4,177,325 ක ඌනතාවයක් ගිණුම් මඟින් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ලැබීම් හා නිකුත් කිරීමේ ගිණුමේ වියදම ඉක්මවූ නිකුත් කිරීම් ශේෂය වූ රු. (4,177,325) ක අගය ශේෂ පත්‍රයේ රු. (3,209,321) ක් ලෙස රු. 968,003 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.6.3 කල වැඩ අත්තිකාරම් ගිණුම

(අ) ණයගැති වැඩිපුර ලැබීම් ගිණුමේ වර්ෂය ආරම්භයේ පැවති රු. 16,892,320 ක ශේෂයෙන් වර්ෂය අවසානය වන විට රු. 3,458,808 ක ණයගැති වටිනාකමක් නිශ්චිතව හඳුනා ගෙන නිසි පරිදි ගිණුම්ගත කර තිබුණු අතර රු. 13,433,512 ක ශේෂයක් හඳුනා ගෙන නොතිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කරන ලද මාසික ඉන්වොයිස් සාරාංශයේ ඇතුලත් එකතුව රු. 615,377 ක් වූ විකුණුම් ඉන්වොයිස් 02 ක් විකුණුම් ආදායමට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් කළවැඩ අත්තිකාරම් ගිණුමේ විකුණුම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2022 හා 2023 වර්ෂ වල විකුණුම් ආදායම ගණනය කිරීමේදී අත්හැරී තිබූ රු. 4,177,300 ක් වටිනා විකුණුම් ඉන්වොයිස් 06 ක් පෙර වර්ෂ ලාභයට ගැලපීම වෙනුවට මෙම වසරේ විකුණුම් වලට ඇතුලත් කර තිබීමෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ රු. 19,615,678 ක මුදලට විකුණුම් ණයට විකුණුම් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් එම අගයෙන් ණයගැති ශේෂයන් වැඩියෙන් දක්වා තිබුණි.

5

CS CamScanner

(ඉ) ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය ප්‍රකාර අදාල වර්ෂයේදී ගනුදෙනුකරුවන් වෙත නිමකර භාරදුන් භාණ්ඩ හා ව්‍යාපෘති වියදම් පිරිවැටුම ලෙස සලකනු ලැබුවද නිම නොවූ ව්‍යාපෘති 04 ක් ඉටු කිරීම වෙනුවෙන් රු. 61,056,929 ක ඉන්වොයිස් නිකුත් කර එම වටිනාකම ණයට විකුණුම් ලෙස ගිණුම් ගත කොට තිබුණි. මෙම කාර්යයන් ගිණුම් වර්ෂය තුල අවසන් කිරීමට නොහැකි වීම හේතුවෙන් අත්තිකාරම් ලෙස ලබා ගත් රු. 40,765,416 ක මුදල විකුණුම් ගිණුමෙන් ඉවත් කොට අත්තිකාරම් ගිණුමට බැර කොට තිබුණි. ඉතිරි විකුණුම් වටිනාකම වූ රු. 20,291,513 ක් අදාළ ගිණුම් තුලින් ඉවත් කල බවට සාක්ෂි නොවීය.

(ඊ) පූර්ව කාලපරිච්ඡේද වැරදි නිවැරදි කිරීම පිණිස පෙර වර්ෂ ගැලපුම් යටතේ රු. 19,916,346 ක් සමුච්චිත ලාභයට ගැලපුම් කර තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 54 වගන්තිය ප්‍රකාරව ඒ පිළිබඳ කිසිදු හෙළිදරවු කිරීමක් සිදු කර නොතිබුණි.

(උ) ගෙවීම් විශ්ලේෂණය අනුව 2024 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම් වටිනාකම රු. 1,310,015 ක් වුවද එය රු. 1,296,368 ක් ලෙස අතිකාල ගෙවීම් ගිණුමට පිටපත් කිරීම හේතුවෙන් අතිකාල වියදම් රු. 13,641 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශනය අනුව 2008 හා 2009 වර්ෂවල පැවති රු.36,941,553 ක ණයගැති ශේෂ එකතුවෙන් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිත කමිටු වාර්තාව ප්‍රකාරව රු. 4,045,992 ක් වූ ණයගැති ශේෂයන් ලියා හැරීම සඳහා අනුමත කර තිබුණද 2008 හා 2009 වර්ෂයට අදාළ ඉහත සඳහන් රු.36,941,553 ක් වූ මුළු ශේෂයම කපාහැර තිබුණි.

**1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත දැක්වෙන ගනුදෙනු හා ශේෂයන් සම්බන්ධයෙන් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| අයිතමය | වටිනාකම රු. | සාක්ෂි නොවීම |
|---|---|---|
| මෝටර් රථ | 70,508,827 | |
| මෝටර් රථ ක්ෂය කිරීම | 120,429 | |
| යන්ත්‍රෝපකරණ | 354,294,760 | විස්තරාත්මක උපලේඛණ |
| යන්ත්‍රෝපකරණ ක්ෂය කිරීම | 6,525,302 | |
| ක්ෂය සංචිත අරමුදල | 1,682,924 | |



CS CamScanner

| | | |
|---|---|---|
| ණයගැතියෝ | 574,183,874 | ශේෂ සනාථන සහතික |
| මු.රෙ. 503(1) ගැලපීම - ගෙවීම | 36,010,388 | විස්තරාත්මක උපලේඛණ |
| මු.රෙ. 503(1) ගැලපීම - ලැබීම | 7,838,301 | |

**1.6.5 ලේඛණ හා පොත්පත් පවත්වා නොතිබීම.**

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| හානිපාඩු ලේඛණ | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන | යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| බැරකම් පිළිබඳ ලේඛණය | මුදල් රෙගුලාසි 445 හි විධිවිධාන | යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලේඛණය | මුදල් රෙගුලාසි 502 (2) හි විධිවිධාන | යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| තොග ලේඛණ | මුදල් රෙගුලාසි 751 හි විධිවිධාන | යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |

**2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට සහ

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.



CS CamScanner

| ඉකුත් වර්ෂයට අදාල වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1(ආ) (ii) | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශනය අනුව 2008 හා 2009 වර්ෂවල පැවති ණයගැති ශේෂ වල එකතුව රු. 36,941,553 ක් වුවද ලියා හැරීම සඳහා අමාත්‍යංශ ලේකම්ගේ අනුමැතිය සහිත කමිටු වාර්තාව ප්‍රකාරව එම ණයගැතියන්ගේ එකතුව රු. 4,045,992 ක් විය. එසේ තිබියදී මූල්‍ය ප්‍රකාශයන්හි 2008 හා 2009 වර්ෂයට අදාළ ඉහත සඳහන් රු. 36,941,553 ක් වූ මුළු ශේෂයම කපාහැර තිබුණි. | 1.6.3(ඔ) |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා හේතු නොදැක්වීම

2024 දෙසැම්බර් 06 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 හි 3.4 වගන්තිය අනුව එක් එක් වැය විෂය සංකේතයන් යටතේ සෑම වැය විෂයක්ම වෙනුවෙන්ම මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා සත්‍ය වියදම් අතර වෙනස එම වැය විෂයේ ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණයෙන් සියයට 5 හෝ රු. 10,000 යන අගයන් දෙකෙන් කවර හෝ වැඩි මුදලකට වඩා වැඩි වන්නේ නම් එම වෙනසට හේතු ඒ.සී.ඒ. 2(ii) ආකෘතියෙහි දැක්විය යුතු වේ. වැය විෂය අංක 310- 2-1-1001 හා 310-2-1-1409 ට අදාලව වෙනසට හේතු දක්වා නොතිබුණි.

### 3.2 සීමා ඉක්මවීම.

(අ) සමාලෝචිත වර්ෂයේදී ගබඩා අත්තිකාරම් කාර්යයන් වෙනුවෙන් වූ සීමාවන් ඉක්මවීම හේතුවෙන් උපරිම හර ශේෂ සීමාව රු.40,000,000 ක සිට රු. 80,000,000 ක් දක්වා වැඩිකර ගැනීමටත්, අවම ලැබීම් සීමාව රු. 200,000,000 ක සිට රු. 50,000,000 ක් දක්වා අඩු කර ගැනීමටත් හා උපරිම බැරකම් සීමාව රු. 50,000,000 ක සිට 60,000,000 ක් දක්වා වැඩිකර ගැනීමටත් 2024 දෙසැම්බර් 12 දින අංක MUDC&H/GA/PP/PL/01/02 දරණ ලිපිය මගින්



CS CamScanner

අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර තිබුණද මෙමෙතක් අනුමැතිය ලැබී නොතිබුණි. මේ සඳහා වූ අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියද මෙමෙතක් ලැබී නොතිබුණි.

(ආ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ අවම බැර සීමාව රු. 13,000,000 ක් දක්වා සංශෝධනය කර ගැනීමට 2024 දෙසැම්බර් 02 දින යොමු කර තිබූ අංක MUDC&H/2024/AD/B/01 දරණ ලිපිය මඟින් ඉල්ලීම් කර තිබුණද ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.

### 3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) මූල්‍ය ප්‍රකාශනයෙහි බැඳීම් හා බැරකම් පිලිබඳ ප්‍රකාශයෙහි බැරකම් වාර්තා කර නොතිබුණද රු. 2,866,424 ක අගයකින් සමාලෝචිත වර්ෂය අවසානයේ බැරකම් වලට එළඹ තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි සංග්‍රහයේ 94(1) රෙගුලාසිය ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට නොබැඳී සිටිය යුතු බව දක්වා ඇතත් නිසි අධ්‍යනයකින් හා සැලසුමකින් තොරව ඇස්තමේන්තු සැකසීම නිසා වැය විෂයයන් 06 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉක්මවා රු. 1,535,278 ක් බැරකම් වලට එළඹ තිබුණි.

### 3.4 ගණන්දීමේ නිලධාරීන් විසින් සිදු කල යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම කල යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති එළදායී ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කල බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.



CS CamScanner

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාල සීමාවන් තුල සියළුම විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, මෙම වාර්තාවේ 4.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති , රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආයතන සංග්‍රහය xix පරිච්ඡේදයේ 6.4 ඡේදය | සංහිඳ සෙවණ මහල් නිවාස සංකීර්ණයේ නිවාස 60 කින් යුත් මහල් 06 ක් පරීක්ෂා කිරීමේදී නිවාස වසා දැමීම නිසා නිවාස 33 ක් පරීක්ෂා කර නොතිබූ අතර පරීක්ෂා කල නිවාස 27 න් නිවාස 06 ක් කුලියට ලබා දී ඇති බව නිවාස පරීක්ෂණ මණ්ඩලය වාර්තා කර තිබුණි. නිවාස අනුරු බද්ධව දීම, මුදල් ගෙවා නවතින අමුත්තන් සහ නේවාසිකයන් තබා ගැනීමද තහනම් බව අදාල රෙගුලාසියේ දක්වා ඇතත් නිවාස කුලියට ලබා දී තිබූ නිලධාරීන් අතරින් නිලධාරීන් තිදෙනෙකුගේ නිවාස 2025 ජනවාරි 20 දින දක්වාම ඔවුන් භාරයේම පැවති බව නිරීක්ෂණය විය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි අංක 504 (1) | දෙපාර්තමේන්තුව විසින් එක් එක් කාර්තුව අවසානයේදී වෙළඳ ණයගැතියන් සහ ණයහිමියන්, නිමි භාණ්ඩ, අමු ද්‍රව්‍ය, ගබඩා භාණ්ඩ හා සැපයුම් සහ අත්තිකාරම් ශේෂයන් සඳහා නියමිත සීමාවන් පිළිබඳ ප්‍රකාශයන් පිලියෙල කොට විගණකාධිපතිවරයාටද පිටපතක් සහිතව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

10

CS CamScanner

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | |
|---|---|---|
| (ඇ) | මුදල් රෙගුලාසි අංක 756 (6) | භාණ්ඩ සමීක්ෂණයෙන් පසුව පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කර 2023 අපහරණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | භාණ්ඩාගාර ලේකම්ගේ අංක MF/CG/02/(iv) හා 2017.06.28 දිනැතිව නිකුත් කර ඇති 01/2017 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය. | වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියලු මුල්‍ය නොවන වත්කම් ලේඛණගත කිරීම යටතේ කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට යැවිය යුතු මුල්‍ය නොවන වත්කම් පිලිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | 2024.12.16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | i. ගිණුම් සකස් කිරීම සඳහා හඳුන්වා දී ඇති මුල්‍ය වාර්තාකරණ ආකෘති වලින් අදාල ආකෘති පමණක් භාවිතා කල යුතු වුවත් එසේ අදාල නොවන ඒසීඒ-1 සිට ඒසීඒ-1 (iii) දක්වා ආදායම් ප්‍රකාශ සම්බන්ධ ආකෘති ඇතුලත් කර තිබුණි.<br>ii. ඒසීඒ-2 (ii) ආකෘතියේ ඉතිරි වීම හෝ ඉක්මවීම සංශෝධිත ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස දැක්විය යුතු වුවද වැඩි මුල්‍යමය අගයක් සහිත වැය විෂයන් වල පමණක් ප්‍රතිශතයන් දක්වා තිබුණි.<br>iii. වැඩ සටහන් අංක 02 හි වැය විෂයයන් 1301 සහ 1304 අතර රු. 900,000 ක මු.රෙ. 66 මාරු කිරීම ඒසීඒ-2(i) ආකෘතියෙහි ඇතුලත් කර නොතිබුණු බැවින් ආකෘතියේ එම වැය විෂයන්හි ශුද්ධ ප්‍රතිපාදනය ලෙස වැරදි අගයක් දක්වා තිබුණි. |

**3.6 තැන්පතු**

වසර දෙකකට වඩා වැඩි කාලයක් තුල නිරවුල් නොවූ කොන්ත්‍රාත් රඳවුම් මුදල් තැන්පතු ශේෂය රු.616,800 ක් හා තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීමට තාවකාලිකව රඳවා ගත් තැන්පතු ශේෂය රු. 3,610,228 ක් සම්බන්ධයෙන් මු.රෙ.571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

11

CS CamScanner

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 දැක්ම හා මෙහෙවර

යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් ඉටු කිරීම සඳහා "ඒ" පංතියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව 1971 ජනවාරි 10 දින ස්ථාපනය කර ඇත.

ඒ අනුව තිරසාර සංවර්ධනය තුලින්, ඉදිරි ශ්‍රී ලාංකීය යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ, නිෂ්පාදන, සේවා සහ පුහුණුව සපයන විශිෂ්ඨතම රාජ්‍ය ආයතනය බවට පත්වීම දෙපාර්තමේන්තුවේ දැක්ම විය. දෙපාර්තමේන්තුවේ කාර්යයන් නිෂ්පාදන ක්ෂේත්‍රය, ඉදිකිරීම් ක්ෂේත්‍රය (බර වැද්දුම්), අළුත්වැඩියා සහ නඩත්තු ක්ෂේත්‍රය සහ යාන්ත්‍රික ඉංජිනේරු උපදේශාත්මක සේවා යන ක්ෂේත්‍රයන් 04 ක් යටතේ විහිදී ඇත.

#### 4.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

සෞඛ්‍ය අමාත්‍යාංශයේ දෙවන මහලේ වහල පිළිසකර කිරීමේ දී වහලයේ වඩා අවදානම් සහිත ස්ථාන ගලවා දිරාගිය කොටස් ඉවත් කර අලුත්වැඩියාව සම්පූර්ණ කර ඇති බවත් එම ප්‍රමාණය එකඟ වූ වැඩ කොටසෙන් සියයට 25 ක් පමණ බවත් සඳහන් කරමින් 2024 නොවැම්බර් 28 දක්වා සිදු කරන ලද වැඩ කොටසට අදාලව රු. 3,780,162 ක බිල්පතක් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව සියයට 20 ක අත්තිකාරම් මුදලක් ලබා ගත හැකිව තිබියදීත් එසේ ලබා නොගෙන දෙපාර්තමේන්තුව මුදල් යොදවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ඉටු කරන ලද වැඩ කොටස් වෙනුවෙන් ලැබිය යුතු මුදල් 2025 ජනවාරි මස වන විටත් ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය.

#### 4.1.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද රු.104,412,899 ක් වූ ඇස්තමේන්තුවට තැපැල් දෙපාර්තමේන්තුව එකඟවී 2018 දෙසැම්බර් 31 දින රු.3,795,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද අදාළ ඉදිකිරීමට යෝජිත ඉඩමෙහි පස සුදුසු නොවන බව 2019 ජනවාරි 13 දින පැවති සාකච්ඡාවේදී තහවුරු වී තිබුණු බැවින් අළුතින් සකස් කරන සැලසුමකට අනුව වෙනත් ස්ථානයක ඉදිකිරීමකට යැයි දක්වා තවත්

12

CS CamScanner

රු.10,710,572 ක් 2019 මාර්තු 14 දිනද රු.7,694,000 ක් 2020 මාර්තු 06 දිනද ලෙස එකතුව රු.22,199,572ක් තැපැල් දෙපාර්තමේන්තුවෙන් අයකරගෙන තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදීද ඉදිකිරීම් වල ප්‍රගතියක් දක්නට නොතිබුණු බැවින් 2024 දෙසැම්බර් 31 දිනටද ව්‍යාපෘතියෙහි ප්‍රගතිය සියයට 10 ක් පමණක් විය. වසර 06 ක් ගත වුවද ව්‍යාපෘතිය නිමකර දීමට හෝ ලද මුදල් ආපසු ගෙවීමට හෝ කටයුතු කර නොතිබුණි.

### 4.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උප වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කල යුතු අතර, 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10(02) ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතු වේ. ඒ අනුව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(02) වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය සමඟ විගණනයට ඉදිරිපත් කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 4.2 වත්කම් කළමනාකරණය

(අ) රජයේ කර්මාන්තශාලාවේ නිෂ්පාදිත භාණ්ඩ ප්‍රදර්ශණය කිරීම සඳහා කර්මාන්තශාලා ගොඩනැගිල්ල ඉදිරිපස ඉදිකර තිබුණු වර්ග මීටර් 265 කින් යුත් ප්‍රදර්ශණාගාරය ඒ සඳහා උපයෝගී කර ගැනීමට කටයුතු නොකොට දීර්ඝ කාලයක සිට වසා දමා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතු රු. මිලියන 2.2 ක වටිනාකමකින් යුත් වාහන 03 ක් ගර්හිත තත්ත්වයේ පැවති අතර අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

මු.රෙ. අංක 880 හි විධිවිධාන ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාල වවුචර,



CS CamScanner

ගෙවීම් කරන ලේඛන අත්සන් කරන අයද ස්වකීය රාජකාරී අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප අඳා පනතට අනුකූලව ඇප තැබිය යුතු බව දක්වා ඇතත් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, සහකාර අධ්‍යක්ෂ (පාලන), සහකාර අධ්‍යක්ෂ (ගැලපුම්), ප්‍රධාන ඉංජිනේරු, ඉංජිනේරු, ප්‍රධාන ගණකාධිකාරී, ගණකාධිකාරී, ගබඩා භාරකරු හා රියදුරන් ඇප තැබීම සිදු කර නොතිබුණි.

**4.4 පාඩු හා හානි**

(අ) සමාලෝචිත වර්ෂයේ අවස්ථා දෙකකදී සොරුන් වැඩහල් භූමියට ඇතුල් වී වැඩහල් අංක 11 (වර්තමාන වැඩහල් අංක 16) හි ඉලෙක්ට්‍රික් උපකරණ හා භාණ්ඩ සොරා ගෙන ගොස් තිබූ බව වාර්තා කර තිබුණි. 2024 ජූනි 15 දින රාත්‍රී භාණ්ඩ හා උපකරණ සොරා ගැනීමෙන් පසු ආයතනයේ ආරක්ෂාව තර කිරීමට නිසි ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් නැවත 2024 ජූනි 17 දින රාත්‍රියේදී ද සොරුන් ආයතනයට ඇතුල්වී භාණ්ඩ සොරා ගෙන ගොස් තිබූ බව නිරීක්ෂණය විය. දින දෙක තුලදී සොරා ගත් බවට හඳුනා ගෙන තිබූ උපකරණ වල වටිනාකම රු. 263,842 ක් බවට තක්සේරු කර තිබූ අතර ආයතන පරිශ්‍රයේ අනාරක්ෂිතව හා ලේඛණ ගත නොකර තිබූ උපකරණ සොරුන් රැගෙන යාමෙන් ආයතනයට සිදුව තිබූ අලාභය ගණනය කිරීමට නොහැකිව තිබුණි.

(ආ) 2024 ඔක්තෝබර් 22 දින කර්මාන්තශාලාවේ ප්‍රදර්ශනාගාරයෙහි ඉදිරිපස වීදුරුව බිඳ දමා සොරුන් ප්‍රදර්ශනාගාරයට ඇතුළුවී වටිනා භාණ්ඩ හා උපකරණ සොරා ගෙන ගොස් තිබුණි. මේ සම්බන්ධයෙන් මු.රෙ. 103(1) හා මු.රෙ. 104(1) යටතේ කටයුතුකර නොතිබූ බව විගණනයට නිරීක්ෂණය විය. එකම වර්ෂයේ අවස්ථා තුනකදී සොරුන් විසින් ආයතනයේ භාණ්ඩ සොරා ගැනීම සිදු කර තිබූ බැවින් ඒවා වළක්වා ගැනීමට ගත යුතු ආරක්ෂක ක්‍රියා මාර්ග අනුගමනය කර නොතිබූ බවත් නිරීක්ෂණය විය.

**4.5 විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම**

2025 මාර්තු 20 දිනැති අංක CAE/A/GF/AQ/2025/01 හා 2025 මාර්තු 25 දිනැති අංක CAE/A/GF/AQ/2025/02 දරන විගණන විමසුම් සඳහා 2025 අප්‍රේල් 30 දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.

**4.6 කළමනාකරණ දුර්වලතා**

(අ) දෙපාර්තමේන්තුවේ එක් එක් වැඩ ඒකක වල සේවකයින් බාහිර ආයතන වලින් ලැබෙන ඇණවුම් වැඩ ඉටු කිරීමට ඒ ඒ වැඩහල් වලින් ආයුධ හා උපකරණ මාර්ග පත්‍ර වල සටහන් තබා රැගෙන යාම කර තිබුණි. බාහිර ආයතන වල කාර්යයන් අවසන් වූ පසුව එම ආයුධ හා



CamScanner

උපකරණ, කර්මාන්තශාලාව වෙත ආපසු භාර දීමට කටයුතු කල යුතු වුවත් 2025 ජනවාරි 25 විගණිත දිනය වන විටත් ආපසු භාර දී නොතිබුණි. ලේඛණ වල සඳහන් තොරතුරු අනුව මෙම ආයුධ හා උපකරණ දෙපාර්තමේන්තුවට නැවත ලබා ගැනීමට වගකිව යුතු නිලධාරින් විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) රජයේ කර්මාන්තශාලාව පවත්වාගෙන යනු ලබන කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඉඩමට අදාල නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට අදාල හිමිකම් සහතික හෝ ඔප්පු ලබා ගෙන නොතිබුණි.

(ඇ) රජයේ කර්මාන්තශාලාවේ පැවති පැරණි පරිගණක මෘදුකාංග පද්ධතියෙහි දුර්වලතා හේතුවෙන් අක්‍රමවත්ව ක්‍රියාත්මක වූ තොග පාලනය, තොග ඇණවුම් කිරීම, මිලදී ගැනීම, ඇස්තමේන්තු සැකසීම ආදී කටයුතු නිසියාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා පැවති පද්ධතිය වැඩි දියුණු කිරීම වෙනුවෙන් 2021 වර්ෂයේදී මිල ගණන් කැඳවා පුද්ගලික ආයතනයක් වෙත රු. 2,954,700 ක් 2021 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. පරිගණක මෘදුකාංග පද්ධතිය මඟින් යලි ඇනවුම් මට්ටමේදී ගබඩා ඇනවුම ස්වයංක්‍රියව නිර්මාණය වී අනුමැතිය සඳහා ඉදිරිපත්වන බවට පිරිවිතරයන්හි දක්වා තිබුනද අතින් ලියන ලද ගබඩා ඇනවුම් මිලට ගැනුම් අංශයට ඉදිරිපත් කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ හිඟ ණය ශේෂ අය කර නොගැනීම.**

i. 2016 වර්ෂයේදී කොළඹ මහ නගර සභාව වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු ආපදා ණය ශේෂය වූ රු. 126,340 ක් වර්ෂ 08 ක කාලයක් ගත වී තිබුණද මෙතෙක් දෙපාර්තමේන්තුව විසින් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ii. විශ්‍රාම ගිය නිලධාරින් 04 දෙනෙකුගෙන් වර්ෂ 20 කට වැඩි කාලයක සිට අය විය යුතු රු. 420,905 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගෙන නොතිබුණි.

iii. විශ්‍රාම ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් පිළිවෙලින් රු. 125,500 ක් හා රු. 177,800 ක් වන ණය ශේෂ වර්ෂ 1 - 5 දක්වා කාලයක් තුල අය නොවී පැවතුණි.

iv. 2009 සහ 2023 වර්ෂ වල වැඩ තහනමට ලක්ව තිබූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු පිළිවෙලින් රු. 142,650 ක හා රු. 27,640 ක ණය ශේෂයන් මෙතෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.



CS CamScanner

v. සේවය අතහැර ගොස් වසර 10 ට වැඩි කාලයක් ගත වූ නිලධාරීන් 5 දෙනෙකුගේ එකතුව රු. 242,500 ක ණය ශේෂයක් හා සේවය අතහැර ගොස් වසර 20 කට වැඩි කාලයක් ගත වූ සේවකයින් දෙදෙනෙකුගේ එකතුව රු. 59,800 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

5. තිරසර සංවර්ධනය

තිරසර සංවර්ධනය පිලිබඳ එක්සත් ජාතින්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂය තුල තිරසර සංවර්ධන අරමුණු කිහිපයක් හඳුනාගෙන තිබුණද ඊට අදාල දර්ශක නිශ්චිතව හඳුනා ගැනීමට හා ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

2024 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිලිබඳ විස්තර පහත දැක්වේ.

| මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 31 | 17 | 14 |
| තෘතියික | 10 | 02 | 08 |
| ද්විතියික | 282 | 114 | 168 |
| ප්‍රාථමික | 445 | 158 | 287 |
| එකතුව | 768 | 291 | 477 |

පුරප්පාඩුව් ඇති තනතුරු 477 ක පුරප්පාඩු පිරවීමට හෝ අවශ්‍යතාවයන්ට අනුව තනතුරු සංඛ්‍යාව සංශෝධනය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

Qabeysingh

එච්.ජේ.ඩී. චාන්දනී අබේසිංහ

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති (වැ.බ) වෙනුවට

16

CamScanner

## 04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| කළ වැඩ අත්තිකාරම් | | | √ |
| ප්‍රාග්ධන වියදම් | | | √ |

## 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| පිරිසුදු ජලය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම | 100% | • ජල පෙරහන් සවි කිරීම<br>• නාන කාමර 10ක් සඳහා ජලය හා සනීපාරක්ෂක පහසුකම් සවි කිරීම | | | √ |
| බල ශක්ති පරිභෝජනය අවම කිරීම (විදුලිය, ජලය) | 100% | • වැසි ජලය රැස් කිරීම සඳහා ටැංකි සවි කිරීම<br>• එම ජලය භෝග වගාව හා වාහන සෝදා හැරීම සඳහා භාවිතා කිරීම. | | | √ |
| පුනර්ජනීය බල ශක්ති ප්‍රභවයන් භාවිතය වැඩි දියුණු කිරීම | 100% | • සූර්යය පැනල සවි කිරීමේ සැලසුම | √ | | |

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- ❖ ජල පෙරහන් දහයක් (10) ක් සවි කිරීම.
- ❖ වැසි ජලය රැස් කිරීම සඳහා ටැංකි 01ක් සවි කිරීම.
- ❖ සූර්යය පැනල සවි කිරීම සඳහා 2024 වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

# 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 31 | 17 | 14 |
| තෘතියික | 10 | 02 | 08 |
| ද්විතියික | 282 | 114 | 168 |
| ප්‍රාථමික | 445 | 158 | 287 |
| **එකතුව** | **768** | **291** | **477** |

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය / අතිරික්තයේ බලපෑම

- ප්‍රාථමික ශ්‍රේණිවල කාර්ය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව 445 ක් වන අතර 287 ක පුරප්පාඩු සංඛ්‍යාවක් පවතී.
- විධායක හා ද්වීතික ශ්‍රේණිවල නිලධාරී ඌණතාවය හේතුවෙන් විෂයන් කීපයක් භාර දී ඇත. එහිදී ඒ ඒ කාර්යයන්හි කාර්යක්ෂමතාවයට බලපෑම් සිදු වී ඇත.
- එකවර ව්‍යාපෘති කීහිපයක කටයුතු කිරීමට සිදුවීමේදි, කාර්ය මණ්ඩල ඌනතාවය, මහත් බලපෑම් ඇති කරයි.
- පවත්නා නිෂ්පාදන කාර්යයන්ට හා ප්‍රාථමික ශ්‍රේණිවල නිලධාරීන්ට වැටුප් හා වේතන ගෙවනු ලබන්නේ දෙපාර්තමේන්තු කළ වැඩ අත්තිකාරම් ගිණුමෙන් වන බැවින් එම මූල්‍ය ශක්තිය ද සලකා බලා බඳවා ගැනීම් කරනු ලැබේ.

6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වූ ආකාරය 2024

| අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.) | පුහුණු කිරීම් වර්ගය (දේශීය,විදේශීය) | පුහුණුවෙන් පසු ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| 1. | නිවාඩු I වැඩසටහන | 78 | දින 01 | 0.00 | දේශීය | සතුටුදායකයි |
| 2. | නිවාඩු II වැඩසටහන | 78 | දින 01 | 0.00 | දේශීය | සතුටුදායකයි |
| 3. | නිවාඩු III වැඩසටහන | 48 | දින 01 | 0.00 | දේශීය | සතුටුදායකයි |
| 4. | මිණුම් | 60 | දින 01 | 0.00 | දේශීය | සතුටුදායකයි |
| 5. | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | 45 | දින 01 | 0.00 | දේශීය | සතුටුදායකයි |
| 6. | මුදල් රෙගුලාසි | 17 | දින 01 | 0.00 | දේශීය | සතුටුදායකයි |
| 7. | පරිගණක භාවිතය සම්බන්ධ පුහුණු වැඩසටහන | 33 | දින 01 | 0.00 | දේශීය | සතුටුදායකයි |
| 8. | බෙයාරිං භාවිතය, නඩත්තුව පිළිබඳ තාක්ෂණික උපදේශනය | 21 | දින 01 | 0.00 | දේශීය | සතුටුදායකයි |
| 9. | ISO විගණනය හා සබැඳි පංචවිධ සංකල්පය | 101 | දින 01 | 0.00 | දේශීය | සතුටුදායකයි |

2024 වර්ෂය සඳහා පුහුණු වැඩසටහන් වෙනුවෙන් මිලියන 1.5ක ප්‍රතිපාදන අනුමත වී තිබූ අතර වැය ශීර්ෂ 310-2-1-0-2401 යටතේ 2024 වර්ෂයේ පහත පරිදි ප්‍රතිපාදන මිලියන 1.5න් 98%ක ප්‍රමාණයක් වියදම් සිදු කරන ලදි.

| අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.) | පුහුණු කිරීම් වර්ගය (දේශීය,විදේශීය) | පුහුණුවෙන් පසු ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| 01. | P.L.C. | 10 | දින 05 | 55,000.00 | දේශීය | සතුටුදායකයි |
| 02. | වාත්තු පස්වල ප්‍රමිතිය හා පිළියෙළ කිරීම | 14 | දින 01 | 25,000.00 | දේශීය | සතුටුදායකයි |
| 03. | CPD Course Welding Technology for Engineering Professionals -IESL | 05 | දින 03 | 86,000.00 | දේශීය | සතුටුදායකයි |
| 04. | Grinding Gap Filling Programme | 02 | දින 03 | 67,500.00 | දේශීය | සතුටුදායකයි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 05. | Design of Anti Corrosive Coating for Metal – CPD Course | 01 | දින 03 | 17,200.00 | දේශිය | සතුටුදායකයි |
| 06. | Work shop on Transport Management | 02 | දින 01 | 14,000.00 | දේශිය | සතුටුදායකයි |
| 07. | Predictive Maintenance Basic Machine Installation Procedures, Vibration Analysis Dynamic Balancing | 15 | දින 01 | 60,000.00 | දේශිය | සතුටුදායකයි |
| 08. | Training Course on Parametric 3D Modeling using Solid works | 02 | දින 01 | 90,000.00 | දේශිය | සතුටුදායකයි |
| 09. | Labour Law for Engineers - CPD course -IESL | 03 | දින 04 | 27,300.00 | දේශිය | සතුටුදායකයි |
| 10. | Plant Transporter Driver Training Programme CIDA | 01 | දින 01 | 55,000.00 | දේශිය | සතුටුදායකයි |
| 11. | Computer Aided 3D modeling using Auto CAD | 01 | දින 01 | 28,000.00 | දේශිය | සතුටුදායකයි |
| 12. | ISO 9001:2015 සම්මත අවශ්‍යතා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 36 | දින 01 | 128,287.05 | දේශිය | සතුටුදායකයි |
| 13. | Process mapping and simulation modeling for performance improvement | 02 | දින 04 | 128,000.00 | දේශිය | සතුටුදායකයි |
| 14. | විනය හා ආකල්ප සංවර්ධනය | 110 | දින 01 | 2100.00 | දේශිය | සතුටුදායකයි |
| 15. | වැටුප් පරිවර්තන | 45 | දින 01 | 0.00 | දේශිය | සතුටුදායකයි |
| 16. | Fitter – NVQ Assessment Fee | 06 | | 60,000.00 | දේශිය | සතුටුදායකයි |
| 17. | Pre Assessment for Awarding National Vocational Qualification of Logistics Operations (Store Keeper) | 01 | දින 01 | 8,000.00 | දේශිය | සතුටුදායකයි |
| 18. | MEng (Research) Intake 2022 | 01 | දින 01 | 100,000.00 | දේශිය | සතුටුදායකයි |
| 19. | Public Procurement Procedures Practices | 01 | දින 01 | 18,100.00 | දේශිය | සතුටුදායකයි |
| 20. | පරිපාලන නිලධාරී ධාරිතා සංවර්ධනය | 01 | දින 01 | 15,000.00 | දේශිය | සතුටුදායකයි |
| 21. | හානි හා පාඩු මු.රෙ. 104 යටතේ වූ පරීක්ෂණ එක් දින පුහුණුව | 02 | දින 01 | 10,000.00 | දේශිය | සතුටුදායකයි |
| 22 | ලිපිගොනුකරණය | 02 | දින 01 | 10,000.00 | දේශිය | සතුටුදායකයි |
| 23. | නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යයභාරය සහ වගකීම | 01 | දින 01 | 13,000.00 | දේශිය | සතුටුදායකයි |

## 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවස්ථාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ. | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ. | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල වේ. | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ. | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම ( මු.රෙ.445 )** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවස්ථාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ. | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ. | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ. | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ. | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවස්ථාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරිම | අනුකූල නොවීම අනාගතයේදි වලක්වා ගැනිමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 05 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ. | | |
| 06 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ. | | |
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 07 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍ර ලේඛ 1-2019ට වැඩිමනක් වශයෙන් DMA/AMC/M/2021/2 හා 2021/08/06 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් ලිපිය අනුව රැස්වීම් පැවැත්වීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවස්ථාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 08 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ. | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ. | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 09 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 9.2 | වාහන ගර්භිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ. | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව, කටයුතු කිරීම | අනුකූල වේ. | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ. | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ. | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| **අංකය** | **අදාළ කර ගත යුතු අවස්ථාව** | **අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)** | **අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම** | **අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග** |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ. | | |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවස්ථාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරිම | අනුකූල නොවිම අනාගතයේදි වලක්වා ගැනිමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනකූල වීම | අනුකූල වේ. | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ. | | 2020 වර්ෂයේ සිට සෑම මසකම ශේෂයන් පරීක්ෂා කර ඒවා පියවා ගැනීමට කටයුතු කරනු ඇත. |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ. | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවස්ථාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 15 | **අදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ. | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ. | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබිම | අනුකූල වේ. | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ. | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබිම | අනුකූල වේ. | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ. | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබිම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවස්ථාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සදහා කෙටි පැහැදිලි කිරිම | අනුකූල නොවීම අනාගතයේදි වලක්වා ගැනිමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලභි ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ. | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරිම හා ක්‍රියාත්මක කිරිමේ කටයුතු අධික්ෂණය කිරිම හා ඇගයිම් සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබිම | අනුකූල වේ. | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරිම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබිම | අනුකූල වේ. | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබිම | අනුකූල වේ. | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබිම | අනුකූල නොවේ. | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරිම , ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධන කිරිම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම පිළිබඳ වගකිම් පවරා ජොෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබිම | අනුකූල වේ. | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්විම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබිම | අනුකූල වේ. | | |